# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

## දක්ෂිණ මණ්ඩපය - සූරියවැව
## නිර්මිත පරිසර සහ අවකාශ විද්‍යා පීඨය

**සුදුසුකම්**

01. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුර I/ II ශ්‍රේණිය තනතුර**

i. ඉල්ලුම්කරුවන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි තනතුරු අංක 02 යටතේ දක්වා ඇති පරිදි කථිකාචාර්ය (පරිවාස) තනතුර සඳහා අවශ්‍ය කරනු ලබන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

සහ

ii. අ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක්.

හෝ

ආ. (i) අවම වශයෙන් මාස 24 ක කාලයකින් යුත් පූර්ණ කාලීන පර්යේෂණයක් සහිතව ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර තිබීම.

හෝ

ඇ. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ තේරීම් කමිටුවේ නිර්දේශය මත කළමණාකරණ මණ්ඩලය මගින් අනුමත කරන ලද ඉහත ආකාරයේ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

සහ

iii. අ. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුර I ශ්‍රේණිය** - පහත සඳහන් අංශ වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා අවම වශයෙන් වසර දොළහක (12) ක පළපුරුද්ද (ඉහත (ii) හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව අවම වශයෙන් වසර හයක (06) ක පළපුරුද්ද තිබිය යුතුය.)

ආ. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුර II ශ්‍රේණිය** - පහත සඳහන් අංශ වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා අවම වශයෙන් වසර හයක (06) ක පළපුරුද්ද

අ. විශ්වවිද්‍යාල මට්ටමින් ඉගැන්වීම
ආ. වෘත්තීය පළපුරුද්ද
ඇ. පිළිගත් ආයතනයක සිදුකරන ලද පර්යේෂණ
ඈ. පශ්චාත් උපාධි අධ්‍යයන

02. **කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර**

i. ඉල්ලුම්කරුවන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි තනතුරු අංක 02 හි (1) හෝ (2) කාණ්ඩය පරිදි කථිකාචාර්ය (පරිවාස) තනතුර සඳහා අවශ්‍ය කරන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

සහ

ii. අ. අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් සම්පූර්ණ කර තිබීම.

හෝ

ආ. අවම වශයෙන් මාස 24 ක කාලයකින් යුත් පූර්ණ කාලීන පර්යේෂණයක් සහිතව ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර තිබීම.

සහ

iii. මෙම ලේඛනයෙහි තනතුරු අංක 01 හි සඳහන් පරිදි ජේ.කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුරට අදාළ වූ වසර 06 ක පළපුරුද්දට වඩා අඩු පළපුරුද්ද.

03. **කථිකාචාර්ය (පරිවාස) තනතුර**

i. අදාල විෂයය සඳහා විශේෂඥතාවය සහිතව පළමු හෝ දෙවන පන්තියේ (ඉහළ පෙල) සාමාර්ථයක් සහිත ගෞරව උපාධියක්

හෝ

ii. අදාල විෂයය සඳහා විශේෂඥතාවය සහිතව දෙවන පන්තියේ (පහළ පෙල) සාමාර්ථයක් සහිත ගෞරව උපාධියක්

හෝ

iii. අ. අදාල විෂය සඳහා විශේෂඥතාවය සහිතව ලබාගත් උපාධිය හෝ අවම වශයෙන් දෙවන පන්තියේ සාමාර්තයක් සහිත වෙනත් ඕනෑම උපාධියක්

සහ

ආ. වර්ෂ 02 කට නොඅඩු නිබන්ධන/ ශාස්ත්‍රීය නිබන්ධන සමග පර්යේෂණ අංගයක් සහිත පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර තිබීම

හෝ

iv. ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ තේරීම් කමිටුවේ නිර්දේශය මත කළමණාකරණ මණ්ඩලය මගින් අනුමත කරනු ලබන අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හෝ වෘත්තීය පළපුරුද්ද.

## ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය

**01. ඉංග්‍රීසි භාෂා උපදේශක - III ශ්‍රේණිය තනතුර**

i. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂ උපාධිය.

හෝ

ii. ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස ඇතුලත් වූ සාමාන්‍ය උපාධිය.

හෝ

iii. විශේෂ/ සාමාන්‍ය උපාධිය සහ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත වෙනත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් අවම වශයෙන් මාස 18 ක කාලයකින් යුත් ඉංග්‍රීසි ඩිප්ලෝමාව.

හෝ

iv. කොළඹ හෝ විවෘත විශ්වවිද්‍යාලයෙන් ලබාගත් ඉංග්‍රීසි භාෂාව දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ පශ්චාත් උපාධිය හෝ ඊට සමාන වෙනත් සුදුසුකමක්*

*පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත වෙනත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් අවම වශයෙන් අවුරුදු 01 ක කාලසීමාවකින් යුක්ත සුදුසුකමක් විය යුතුය.

හෝ

v. ඉංග්‍රීසි පුහුණු ගුරු සහතිකය ලබාතිබීම සහ ඉන් පසුව අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්ද

හෝ

vi. විශේෂ ඉංග්‍රීසි පුහුණු ගුරු සහතිකය ලබාතිබීම සහ ඉන් පසුව අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්ද

හෝ

vii. අධ්‍යාපන විද්‍යාලයකින් ලබාගත් ඉංග්‍රීසි දෙවැනි භාෂාවක් ලෙස ඉගැන්වීම පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සහ ඉන්පසු අවම වශයෙන් අවුරුදු 03 ක ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ පළපුරුද්ද.

හෝ

viii. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය මගින් පිරිනමන අවම වශයෙන් අවුරුදු 02 ක කාලසීමාවකින් යුක්ත ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සහ ඉන්පසුව අවම වශයෙන් අවුරුදු 03 ක ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ පළපුරුද්ද.

සහ

ix. ඉංග්‍රීසි භාෂාව සහ සිංහල/ දෙමළ භාෂාවන් වල මනා පරිචය.

**වැටුප් පරිමාණ**

01. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය තනතුර

:- U-AC 3 (I) Rs. 91,310 - 7x2,170 – 106,500 p.m. +(151% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

02. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුර

:- U-AC 3 (II) Rs. 79,360 - 11x1,630 – 97,290 p.m. +(151% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

03. කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර

:- U-AC 3 (III) Rs. 69,580 - 5x1,630 – 77,730 p.m. +(131% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

04. කථිකාචාර්ය (පරිවාස) තනතුර

:- U-AC 3 (IV) Rs. 54,600 - 10x1,335 - 67,950 p.m. +(115% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

05. ඉංග්‍රීසි භාෂා උපදේශක III ශ්‍රේණිය තනතුර

:- U-AS 1 (II) Rs. 41,095 - 18x660– 52,975 p.m. + (වෙනත් අනුමත දීමනා)

**වෙනත් ප්‍රතිලාභ**

- සුදුසුකම් ලත් තනතුරු සඳහා සප්තවාර්ෂික නිවාඩු, අධ්‍යන දීමනා සහ පර්යේෂණ දීමනාව
- සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා දායකත්වය, විශ්‍රාම පාරිතෝෂික දීමනාව
- නොමිලේ සෞඛ්‍ය රක්ෂණාවරණයක්
- වාර්ෂික දිරි දීමනා
- සේවකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව
- විශ්වවිද්‍යාලයීය රෝහලෙහි ප්‍රතිකාර ලබා ගැනීමේ දී ප්‍රමුඛතාවය
- සුබසාධක ප්‍රවාහන සේවය සහ වෙනත් වරප්‍රසාද